- ***<u>සැබෑ රණවිරුවන් සිරගත කරමින්, කොටි ත්‍රස්තවාදීන් නිදහස් කරමින්, කොටි ඩයස්පෝරාව හා ජාත්‍යන්තරය පිනවන මේ දෙබිඩි ආණ්ඩුව ගෙදර යවමු….</u>***
- ***<u>නියම ජාතිවාදය උසිගන්වන්නේ හා ලේ දැකීමේ අවස්ථාව නිර්මාණය කරන්නේ ආණ්ඩුවයි…</u>***
- ***<u>"එන්න එපා ජාතිවාදය අවුස්සන්න" කියලා කාටද කියන්නේ? කියන්න කණ්ණාඩියක් ගාවට ගිහිල්ලා. ඔයා තමයි නැති ජාතිවාදයක් අවුස්සන්නේ.</u>***
- ***<u>මේක තමයි "සමාජවාදී පොලිස් සංගමය". ඒකේ ප්‍රධානියා තමයි "ජාතික සංවිධායක පොලිස්පති ප්‍රියන්ත"</u>***
- ***<u>ජූලි චන් නෝනා තමයි මේ ආණ්ඩුවේ "බාහිර බලවත් බවලතා"</u>***

වත්මන් ආණ්ඩුව බලයට පැමිණි දා සිට යුධ අපරාධ පිළිබඳ අභූත චෝදනා නගමින් මෙරට නාවික හමුදා, යුද හමුදා හා බුද්ධි අංශ රණවිරුවන් දඩයම් කිරීමට සැරසෙන අතර, පසුගියදා ආරක්ෂක ලේකම්වරයා විසින් ත්‍රස්තවාදීන් යැයි "ජාත්‍යන්තරය පවා පිළිගත්" නමගිය කොටි ත්‍රස්තවාදීන් පිරිසක් නිදහස් කරමින් තමන්ට මැතිවරණ කටයුතු සඳහා වියදම් කළ "දෙමළ ඩයස්පෝරාව හා ජාත්‍යන්තරය" පිනවීමට උත්සාහ ගනිමින් මේ රටේ "දෙබිඩි පිළිවෙතක්"" අනුගමනය කරමින් සිටින බව ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවස මහතා චෝදනාා කළේය.

අද (20) බත්තරමුල්ලේ පිහිටි පක්ෂ මූලස්ථානයේදී විශේෂ මාධ්‍ය හමුවක් අමතමින් ජ නජ පෙ කියා සිටියේ, ජනාධිපති අනුර කුමාර මහතාගේ පාලනය යටතේ රජය බටහිර ගැති සහ දෙමළ ඩයස්පෝරාවට ගැති "දෙබිඩි ප්‍රතිපත්තියක්" ක්‍රියාත්මක කරමින් සිටින බවයි. ජනාධිපතිවරයා මේ වන විට නාවික හමුදාවේ සහ හමුදා බුද්ධියංශවල නිලධාරීන් ඉලක්ක කරගත් ක්‍රියාමාර්ග ගනිමින්, එය "රණවිරු දඩයමක්" නොවන බවට ප්‍රකාශ කළද, මෙම පියවර අතීතයේ සිටම බටහිර සහ ඩයස්පෝරාව විසින් ආරක්ෂක හමුදා වෙත එල්ල කරන මානව අපරාධ සහ යුධ අපරාධ චෝදනා සනාථ කිරීමට උදව් දෙන ක්‍රියාමාර්ගයක් බව වීරවංශ මහතා අවධාරණය කළේය.

ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේදී ආරක්ෂක හමුදාවල අපරාධ හඳුනාගෙන නීතිය ක්‍රියාත්මක කරන බව පවසද්දී, ඔහුගේ ආරක්ෂක ලේකම්වරයා විසින් මීට පෙර ගැසට් නිවේදනයක් නිකුත් කරමින්

ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ මුදල් විශුද්ධිකරණය පිළිබඳ ජාත්‍යන්තරව සනාථ වූ චෝදනා සහිත "එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදයට සම්බන්ධ, දෙමළ ජාතිකයින් එකොළොස් දෙනෙකුගේ නම්" තහනම් ලැයිස්තුවෙන් ඉවත් කර නිදහස් කර ඇති බවට හෙතෙම චෝදනා කළේය.

*"එතකොට මේ පුද්ගලයෝ තමයි - "කාන්තිලිංගම් ප්‍රේමරාධි, බාලසුබ්‍රමනියම් ශ්‍රී කදරාජා, කෝමලිස් ප්‍රභාකරන්, ඉලයතම්බි තිරේස් කුමාරන්, කන්දයියා පුංජිතපාදම්, කාසිනාදන් සනේෂලිංගම්, ක්‍රිෂ්ණ කුට්ටි සුකුමාරන් හෙවත් උදයන්, කුරුකුලසිංහම්, තේවරාසා සෙබමාලෙයි, ජෝයි ජිනස්තුරයි රාසා ප්‍රියදර්ශනී, වේළුපිල්ලේ සිවනඩියර්" - මේ උදවියව ත්‍රස්තවාදයට මුදල් උපයපු, මුදල් විශුද්ධිකරණය පිළිබඳ චෝදනා තියෙන, ඒක ජාත්‍යන්තරව සනාථ වී තිබෙන, ඒ අනුව තහනම් පුද්ගලයන්ගේ නාම ලේඛනයට ඇතුළත් කර තිබ්ච්ච මේ පුද්ගලයන්ගේ නම් මේ ලේඛනයෙන් අයින් කරනවා. ඒ කියන්නේ ඔවුන්ට දැන් නිදහසේ ශ්‍රී ලංකාව ඇතුළට යන්න එන්න පුළුවන්. ඔවුන්ට ඕනම මුදල් ගනුදෙනුවක නිරත වෙන්න පුළුවන්. ත්‍රස්තවාදයට නැවත අවශ්‍ය නම් මුදල් පොම්ප කරන්න පුළුවන්. ඒ නිදහස ඒ ලැයිස්තුවල ඉන්න අයට දෙනවා. මෙහේ බොරු චෝදනා පටලව පටලවා ආරක්ෂක හමුදා දඩයමට පොට පාදා ගන්නවා. ඇවිල්ලා කියනවා චෝදනා තියෙනවලු, අපි නීතිය ක්‍රියාත්මක කරනවලු, ඒකට "රණවිරු දඩයම කියලා කියන්න එපාලු. එතකොට මේ මේ "කොටියන්ට තියෙන්නේ මොන" චෝදනාද? මේගොල්ලෝ ගැසට් එකෙන් අයින් කරන්නේ මොන විදිහටද? මේගොල්ලෝ හොඳ වෙලාද? මේගොල්ලෝ හොඳ වෙච්චි අරගොල්ලෝ නරක් වෙන්නයි මොකක්ද තියෙන හේතුව?"*

ජාත්‍යන්තරව තහනම් කරන ලද මෙම පුද්ගලයන් නිදහස් කිරීමේ පියවර මඟින් ඔවුන්ට නැවත ශ්‍රී ලංකාව තුළ මුදල් ගනුදෙනු කිරීමට සහ ත්‍රස්තවාදයට මුදල් පොම්ප කිරීමට අවස්ථාව ලැබෙන බව පෙන්වා දුන් වීරවංශ මහතා, ජිනීවා මානව හිමිකම් කොමිසමේ ශ්‍රී ලංකාවට හතුරු යෝජනාවට විරුද්ධව ඡන්ද විමසීමක් ඉල්ලා නොසිටියේ ඡන්දයට සල්ලි වියදම් කළ දෙමළ ඩයස්පෝරාව සමඟ ඇති කොන්ත්‍රාත්තුව නිසා බවටද චෝදනා කළේය. එමෙන්ම, ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ ආරක්ෂක ගිවිසුමක් අත්සන් කර ශ්‍රී ලංකාව ඉන්දු පැසිෆික් සාගර කලාපයේ ඇමරිකානු න්‍යාය පත්‍රයේ පාර්ශවකරුවෙකු බවට පත් කර ඇති බවත්, එම නියම ගිවිසුම පාර්ලිමේන්තුවට ලබා නොදී නොමඟ යවන බවත් හෙළි කළේය.

වීරවංශ මහතා වැඩිදුරටත් කියා සිටියේ, ආර්ථික අසාර්ථකත්වය සහ ජනප්‍රියතාව බිඳ වැටීම හමුවේ, රජය විසින් රටේ මහා සංස්කෘතියට පහර දෙමින් සහ ආගමික කටයුතු සම්බන්ධයෙන් ගැටලු නිර්මාණය කරමින් "නැති ජාතිවාදයක් අවුස්සන්න" උත්සාහ කරන බවයි. ත්‍රිකුණාමලයේ බුදු පිළිමේ ඉවත් කිරීම, බුද්ධ ශාසන අමාත්‍යාංශය අහෝසි කිරීම, පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලයට අන්‍ය ආගමික උගතුන් පත් කිරීම, සහ බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ලොක්කා බවට අනාගමික මත දරන්නෙක් පත් කිරීම වැනි ක්‍රියාමාර්ග ගෙන ඇත්තේ ජනාධිපති අනුර කුමාර මහතාගේ ආණ්ඩුව මගින් බවත්, මෙය ජාතිවාදයට ඉඩ නොදෙන බවට ජනාධිපතිවරයා කරන ප්‍රකාශයන් හා පරස්පර වන බවත් ඔහු පැවසීය.

ආණ්ඩුවේ ආර්ථික කළමනාකරණය බිලියනපතියන්ගේ අවශ්‍යතාවන්ට අනුව සිදුවන බව පෙන්වා දුන් වීරවංශ මහතා, ජනාධිපති අනුර කුමාර මහතාට අමතරව රාජ්‍ය පාලනයේ ආර්ථික කළමනාකරණය පිළිබඳ සියලු උපදෙස් ගන්නේ “ප්‍රකෝටිපති පස් දෙනෙකුගෙන්” යුත් "සුපිරි චෞර පහ" හෙවත් “පස්දුන් කට්ටුව” හරහා බවට ප්‍රබල හෙළිදරව්වක් කළේය. මෙම පස් දෙනා නම් “මලික් සමරවික්‍රම, ධම්මික පෙරේරා, ක්‍රිෂාන් බාලේන්ද්‍ර, හනීෆ් යූසුෆ්, සහ ඉෂාර නානායක්කාර” බව හෙතෙම සඳහන් කළේය. රුපියල් ලක්ෂයක පිරිවැටුමක් ඇති පුංචි කඩේට පවා වැට් (VAT) බද්ද බලපාන ආකාරයට එහි පරාසය පළල් කළේ මෙම "පස්දුන් කට්ටුවේ" න්‍යාය පත්‍රය අනුව බවට ද ඔහු චෝදනා කළේය.

ආර්ථික වශයෙන් රජය අසාර්ථක වී ඇති බවට සාක්ෂි ලෙස, 2025ට වෙන් කළ ප්‍රාග්ධන වියදම්වලින් 22%ක් පමණක් වියදම් කර 78%ක් භාණ්ඩාගාරයට ආපසු හරවා යවා ඇති බව වීරවංශ මහතා පැවසීය. මෙසේ "උතුරන" භාණ්ඩාගාරයේ මුදල්වලින් ගොවීන්ගෙන් ලොකු ලූණු, අල සහ බඩ ඉරිඟු මිලදී ගැනීමට හෝ හිරකරුවන්ට හෝ ත්‍රිවිධ හමුදාවට ලබා දීමට රජයට මොළයක් නොමැති බවද හෙතෙම සඳහන් කළේය. එසේම, නිල නිවාස නොගන්නා බවට පොරොන්දු වුවද හත් දෙනෙකුට නිල නිවාස ලබා දී ඇති බවත්, දුම්රියෙන් ගමන් කරන බව කියූවද ඩබල් කැබ් රථ 1750ක් මිලදී ගැනීමට මුදල් වියදම් කරන බවත් ඔහු වැඩිදුරටත් පැහැදිලි කළේය. වීරවංශ මහතා අවසන් වශයෙන් රටේ ජනතාවට අනතුරු අඟවමින් කියා සිටියේ, “නියම ජාතිවාදය උසිගැන්වීම සහ ලේ දැකීමේ අවස්ථාව නිර්මාණය කිරීමට ඉඩ දීම සිදු කරන්නේ ආණ්ඩුවෙන්” බවත්, එම පරගැති පාලනය පරාජය කිරීම සඳහා බුද්ධිමත්ව ක්‍රියා කළ යුතු බවත්ය.

<u>ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ මහතා</u>

<u>මාධ්‍ය හමුවේ කරන ලද සම්පූර්ණ දේශනය මෙසේය.</u>

සුභ උදෑසනක් වේවා මාධ්‍යවේදී ඔබ සියලු දෙනාට. අද මේ මාධ්‍ය සාකච්ඡාවට මා සමඟ සම්බන්ධ වෙනවා ගම්පහ ප්‍රාදේශිය සභාවේ ජාතික නිදහස් පෙරමුණේ මන්ත්‍රී එච්. පී. නන්ද කුමාර සහෝදරයා, ඒ වගේම කොළඹ මහනගර සභාවේ ජාතික නිදහස් පෙරමුණේ නාගරික මන්ත්‍රී උපුල් ද සිල්වා සහෝදරයා. මේ මාධ්‍ය සාකච්ඡාව අපි කැඳවන්න විශේෂයෙන් තීරණය කළේ පසුගිය දිනක, ආසන්නම දිනයේ ජනාධිපති අනුර කුමාර පාර්ලිමේන්තුවට හදිසියෙම ප්‍රාදූර්භූත වෙලා “කරපු කතාවක්” සමඟ බැඳුණු බැරෑරුම් කරුණු කීපයක් පිළිබඳව මේ රටේ පොදු ජනතාව දැනුම්වත් කරන්න, ඔබේ මාධ්‍ය හරහා.

විශේෂයෙන්ම ජනාධිපතිවරයාගේ කතාවේ, සාමාන්‍යයෙන් අපි දන්නවා, 159 දෙනාට යම් යම්තාක් දුරට බඩ බුරුල් වුනොත් ඒක සුවපත් කරන්න, ඒකට ප්‍රතිකර්ම යොදන්න ජනාධිපතිවරයා සියලු වැඩ නවතා පාර්ලිමේන්තුව කරා සංක්‍රමණය වෙනවයි කියලා. අපි සාමාන්‍යයෙන් දැන් මේ අවුරුද්දකට වැඩි පාලන කාලය තුළ අත්දැකීමෙන් වටහාගෙන තියෙනවා. ඉතින් ඒ අනුව ජනාධිපතිවරයා කලබලේ ඇවිල්ලා මේ

කරපු කතාවේදීත් ඉතාම බැරෑරුම් ලෙස අවධානයට යොමු කළ යුතු කාරණා දෙකක් අපි සාකච්ඡාවට භාජනය කළ යුතුයි.

පළවෙනි එක තමයි ''නාවික හමුදාවේ සහ හමුදා බුද්ධි අංශවල නිලධාරීන් කරපු යම්කිසි අපරාධ වගයක් හඳුනගෙන තියෙනවා. අපි නාවික හමුදාවේ සහ බුද්ධි අංශවල වගේම ත්‍රිවිධ හමුදාවේ ගරුත්වය වෙනුවෙන් ඒ අයට නීතිය ක්‍රියාත්මක කරනවා'' කියලා ජනාධිපතිවරයා තමන්ගේ කතාවේදී කරපු සඳහන.

අපි දන්නවා මේ ආණ්ඩුවත් බලයට ආපු වෙලේ ඉඳලා අභූත චෝදනා එල්ල කරලා නාවික හමුදාවේ හිටපු නිලධාරියෙක්, ''නාවික හමුදාපති'' තුමාව මාස තුනක පමණ කාලයක් අත්අඩංගුවේ රඳවා තබාගෙන හිටියා. දැනට ඉන්නවා නාවික හමුදාවේ බුද්ධි අංශයේ ඒ කාලේ හිටපු ''විශ්‍රාමික ප්‍රධානියෙක්'' දැනට ඉන්නවා අත්අඩංගුවට අරගෙන. ඒ විදියට යුධ හමුදා බුද්ධි අංශයේ උදවියටත් අතරින් අතරෙහිව යම් යම් ක්‍රියා මාර්ග ගනු ලැබුවා.

සාමාන්‍යයෙන් ඉතාම ''බටහිර ගැති පාලනයක්'' බලයට පැමිණීමෙන් පස්සේ, ඒ බටහිර රටවල් සහ දෙමළ ඩයස්පෝරාව එල්ල කරන ප්‍රධාන චෝදනාව තමයි ''අපේ ආරක්ෂක හමුදාවන් යුද්ධය ක්‍රියාත්මක වෙන කාල පරිච්ඡේදය තුළ මානව අපරාධ, යුධ අපරාධ සිදු කළාය කියන ජනප්‍රිය චෝදනාව''. ඒ චෝදනාව සනාථ කිරීමට තුඩු දෙන ආකාරයේ ක්‍රියාමාර්ග සාමාන්‍යයෙන් බටහිරට ගැති, දෙමළ ඩයස්පෝරාවට ගැති පාලනයක් බිහි වුණාම අපේ රටේ දකින්න තියෙන දෙයක්.

මිලේනියම් සිටි සිද්ධියේ සිට එවැනි උදාහරණ සිද්ධි අපිට අනන්ත අප්‍රමාණ ප්‍රමාණයක් සිහියට නගන්න පුළුවන්. එතකොට පහුගිය යහපාලන ආණ්ඩු කාලෙත් මේක මේ විදිහටම ඉතා ප්‍රබලව සිද්ධ වුණා. සමහර දේවල් වලක්වා ගන්නත් පුළුවන්කම ලැබුණා.

දැන් මේ ආණ්ඩුවත් බලයට ආපු වෙලේ ඉඳලා මේ ක්‍රියාමාර්ගයේ නියලෙනවා. දැන් ඒක එක්තරා දුරකට තීව්‍ර කරන්න, ඉදිරි පියවරකට, ඉදිරි පිම්මකට ගෙනියන්න තමයි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ පුරාජේරු කතාව කියන්නේ. ''නාවික හමුදාවේ සහ යුධ හමුදා බුද්ධියංශවල නිලධාරීන් කරපු යම්කිසි අපරාධ වගයක් හඳුනගෙන තියෙනවා. අපි නාවික හමුදාවේ සහ බුද්ධියංශවල වගේම ත්‍රිවිධ හමුදාවේ ගරුත්වය වෙනුවෙන් ඒ අයට නීතිය ක්‍රියාත්මක කරනවයි'' කියලා තමයි මේ කියන්නේ. ඒ වගේම එතුමා කියනවා මේක ''සුපුරුදු විදියට රණවිරු දඩයම කියලා හඳුන්වන්න'' එපා කියලා.

අපි අහන්න කැමතියි දැන් මෙහෙම කියන ජනාධිපතිවරයාගේ ආරක්ෂක ලේකම් පහුගිය දවසක විශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කරනවා. ''ත්‍රස්තවාදයට මුදල් සැපයීම හා ඊට අදාළ ක්‍රියාකාරකම් හේතුවෙන් නම් කර ලයිස්තුගත කර තිබිච්ච'' ත්‍රස්තවාදයට සම්බන්ධ, එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදයට සම්බන්ධ ''දෙමළ

ජාතිකයින් එකොළොස් දෙනෙකුගේ නම් ඒ ගැසට් නිවේදනයෙන් ඉවත් කරන්න''. කලින් ඒක ඒගොල්ලෝ තහනම් පුද්ගලයන් හැටියට ගැසට් කරලා තිබුණා. ඒ ගැසට් නිවේදනයෙන් ඒ නම් 11 ඉවත් කරලා නැවත ''ඒ අයව නිදහස් කරා'' ඒ චෝදනා වලින්.

ඒක කරේ ජනාධිපති අනුරගේ යටතේ ඉන්න ආරක්ෂක ලේකම්. එතකොට මේ පුද්ගලයන් ''එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නියෝග වලට අනුව'' ලැයිස්තුගත කරලා තිබ්බ පුද්ගලයන්. ඒ කියන්නේ ජාත්‍යන්තරව සනාථ වෙලා තිබෙනවා. මේගොල්ලෝ ත්‍රස්තවාදයට මුදල් හදල් පොම්ප කරා. මුදල් විශුද්ධිකරණය පිළිබඳ චෝදනා තියෙනවා. ඒ විදියේ බරපතල චෝදනා තියෙන පිරිසක් තමයි මේ නිදහස් කළේ. එතකොට ආරක්ෂක ලේකම් ''සම්පත් තුයියකොන්තා'' මේක කරන්නේ නැහැ ජනාධිපති අනුර කුමාරගේ එකගතාවකින් තොරව.

එතකොට මේ පුද්ගලයෝ තමයි - ''කාන්තිලිංගම් ප්‍රේමරාධි, බාලසුබ්‍රමනියම් ශ්‍රී කදරාජා, කෝමලිස් ප්‍රභාකරන්, ඉලයතම්බි තිරේස් කුමාරන්, කන්දයියා පුංජිතපාදම්, කාසිනාදන් සනේෂලිංගම්, ක්‍රිෂ්ණ කුට්ටි සුකුමාරන් හෙවත් උදයන්, කුරුකුලසිංහම්, තේවරාසා සෙබමාලෙයි, ජෝයි ජිනස්තුරයි රාසා ප්‍රියදර්ශනී, වේළුපිල්ලේ සිවනඩියර්'' - මේ උදවියව ත්‍රස්තවාදයට මුදල් උපයපු, මුදල් විශුද්ධිකරණය පිළිබඳ චෝදනා තියෙන, ඒක ජාත්‍යන්තරව සනාථ වී තිබෙන, ඒ අනුව තහනම් පුද්ගලයන්ගේ නාම ලේඛනයට ඇතුළත් කර තිබ්බ්ව මේ පුද්ගලයන්ගේ නම් මේ ලේඛනයෙන් අයින් කරනවා. ඒ කියන්නේ ඔවුන්ට දැන් නිදහසේ ශ්‍රී ලංකාව ඇතුළට යන්න එන්න පුළුවන්. ඔවුන්ට ඕනම මුදල් ගනුදෙනුවක නිරත වෙන්න පුළුවන්. ත්‍රස්තවාදයට නැවත අවශ්‍ය නම් මුදල් පොම්ප කරන්න පුළුවන්. ඒ නිදහස ඒ ලැයිස්තුවල ඉන්න අයට දෙනවා. මෙහේ බොරු චෝදනා පටලව පටලවා ආරක්ෂක හමුදා දඩයමට පොට පාදා ගන්නවා. ඇවිල්ලා කියනවා චෝදනා තියෙනවලු, අපි නීතිය ක්‍රියාත්මක කරනවලු, ඒකට ''රණවිරු දඩයම කියලා කියන්න එපාලු. එතකොට මේ මේ ''කොටියන්ට තියෙන්නේ මොන'' චෝදනාද? මේගොල්ලෝ ගැසට් එකෙන් අයින් කරන්නේ මොන විදිහටද? මේගොල්ලෝ හොඳ වෙලාද? මේගොල්ලෝ හොඳ වෙච්චි අරගොල්ලෝ නරක් වෙන්නයි මොකක්ද තියෙන හේතුව?

යුද්ධය දිනලා සාමය දිනාදීපු ආරක්ෂක හමුදා නරක් වෙන්නයි, තුයියකොන්තගේ ගැසට් එකෙන් මේ එකොළොස් දෙනා අයින් කරන්නයි. ඒ ''දෙබිඩි ප්‍රතිපත්තිය'' අපි වටහා ගන්න ඕනේ කොහොමද? ඒ දෙබිඩි ප්‍රතිපත්තිය වෙන මොකක්වත් නෙවෙයි. ''තමන්ට ඡන්දයට සල්ලි වියදම් කරපු, පොම්ප කරපු දෙමළ ඩයස්පෝරාවේ කොන්ත්‍රාත්තුව''. ජිනීවා මානව හිමිකම් කොමිසමේ ශ්‍රී ලංකාවට හතුරු යෝජනාවට විරුද්ධව ඡන්ද විමසීමක් ඉල්ලුවේ නැත්තේ ''කොන්ත්‍රාත්තුව'' අනුව. ඒ අනුව තමයි මේ නම් 11 තහනම් නාමලේඛනයෙන් ඉවත් කරන්නේ.

කොටින්ව, ''වලංගු චෝදනා තියෙන කොටින්ව ඒ තහනම් නාමලේඛනයෙන් අයින් කරන ආණ්ඩුව මෙහෙ ඇවිල්ලා කියනවා නාවික හමුදාවේ සහ යුධ හමුදා බුද්ධියංශයේ ඇතැමුන්ගේ අපරාධ පිළිබඳ චෝදනා තිබෙනවා, ඒවට විරුද්ධව අපි නීතිය ක්‍රියාත්මක කරනවා, ''රණවිරු දඩයම කියලා'' ඒකට

කියන්න එන්න එපා කියලා. නැත්නම් මොකක්ද අනුර කුමාර මහත්තයෝ මේකට කියන්නේ? මොන දඩයම කියලද? මේක තමයි ''රණවිරු දඩයම''. රනිල් වික්‍රමසිංහ කරත් ඒක තමයි රණවිරු දඩයම. වෙන කවුරු හරි කරත් ඒක තමයි රණවිරු දඩයම. අනුර කුමාර පාර්ලිමේන්තුවේ ඇවිල්ලා තොරම්බල් කරලා කිව්වත් ඒක තමයි රණවිරු දඩයම.

ඒ නිසා මේ.... දේශද්‍රෝහී න්‍යාය පත්‍රයක් අතේ තියාගෙන මේ පොරටෝක් දීගෙන යන්නේ. එහෙම නැත්නම් කොටියන් 11ක් කළු ලැයිස්තුවෙන්, තහනම් ලයිස්තුවෙන් අයින් කරන ගමන් ''මේ රටේ සාමය දිනාදීපු නාවික හමුදාවටයි, යුධ හමුදා බුද්ධියංශයටයි'' අපරාධ චෝදනා එල්ල කර කර දඩයම් කරන්නේ මොකටද? මොකක්ද ඒකට හේතුව. අරගේල්ලන්ට තියෙන චෝදනාවලින් කිසිම වග විභාගයක් නැතිව නිදොස්කොට නිදහස් කරනවා නම්ටික. ඒවට ප්‍රශ්නයක් නෑ . හැබැයි කොහෙවත් ඉන්න අර අපේ රට නිදහස් කරගත්තු රණ විරුවන්ගේ චෝදනා වලට විරුද්ධව ක්‍රියාමාර්ග තෝරනවා, අධිකරණ ක්‍රියාමාර්ගන්වා, නීතිය ක්‍රියාත්මක කරනවයි කියනවා, ඒකට ''රණවිරු දඩයම'' එහෙම කියන්න එපාලු. නිසා බොහොම පැහැදිලියි... මේ අය මේ කරන්නේ වෙන මොකක්වත් නෙවෙයි. බටහිර රටවල් වලටයි, එල්.ටී.ටී.ඊ. ඩයස්පෝරාවටයි ඕන කොන්ත්‍රාත්තුව.

දැන් ඇමරිකා එක්සත් ජනපදයත් එක්ක ආරක්ෂක ගිවිසුමක් අත්සන් කළා. මම ඒ ටේබල් කරපු එකේ පිටපතක් ගෙන්න ගත්තා. ඒකේ මොනවා අත්සනක්වත් නැහැ. සිංහල පරිවර්තන පිටපතක්. ඒක ගිවිසුම නෙවෙයි. ගිවිසුම පිළිබඳ සංක්ෂිප්ත පරිවර්තනයක් විය හැකියි. හැබැයි ඒකේ අත්සන් මොකක්වත් නැහැ. ගිවිසුම නම් අත්සන් කරේ ඉංග්‍රීසියෙන්. ඉංග්‍රීසියෙන් අත්සන් කරපු ගිවිසුමයි සභාගත කරන්න ඕනේ. ''පාර්ලිමේන්තුව පවා නොමඟ යවනවා''. ඒ ගිවිසුම් පාර්ලිමේන්තුවට දෙන්නෙත් නැහැ. එතකොට එහෙන් ආරක්ෂක ගිවිසුම් අත්සන් කරලා, මේ ඉන්දු පැසිපික් සාගර කලාපයේ ඇමරිකානු න්‍යාය පත්‍රයේ පාට්නර් කෙනෙක්, පාර්ශවකරුවෙක් බවට ශ්‍රී ලංකාව පත් කරනවා.

එක පැත්තකින් ඒවා කරනවා. අනිත් පැත්තෙන් කොටින්ගෙ නාම ලේඛනේ ඉන්න, තහනම් නාමලේඛනේ ඉන්න කට්ටියව ඒ නාම ලේඛනයකින් අයින් කරනවා. අනිත් පැත්තෙන් ආරක්ෂක හමුදාවලට නාවික හමුදාවල ඉන්න යුද හමුදා බුද්ධි නිලධාරීන් කොටු කරන්න සැලසුම් ගහකවා. ඒ ස්සේ මේ ''නල්ලමලේ ජනාධිපති'' කියනවා ''ජාතිවාදයට ඉඩ දෙන්නෑලු''.

දැන් ජාතිවාදය කවුද පැතිරෙව්වේ?

එල්.ටී.ටී.ඊ.යට මුදල් හදල් වියදම් කරා, මුදල් විශුද්ධිකරණය කළා කියලා කළු ලැයිස්තුවේ හිටපු නම් එකොළහ අයින් කළේ අනුර කුමාර ජනාධිපතිනේ. එයාගේ ආරක්ෂක ලේකම්නේ. අපි කිව්වද වෙන කවුරුහරි කියලා. මෙතන ජාතිවාද ප්‍රශ්නයක් නැහැ. ත්‍රස්තවාදී නාම ලේඛනයෙන් නම් 11ක් එළියට දාන්නේ වෙන කවුරුවත් නෙමෙයි, ජනාධිපති අනුර කුමාරගේ ආරක්ෂක ලේකම්නේ. ත්‍රිකුණාමලයේ

බුදු පිළිමේ අයින් කරේ දෙමළ මිනිස්සුද? මුස්ලිම් මිනිස්සුද? නැහැ. අනුර කුමාරගේ පොලිසියනේ. මේ පොලිසිය ඉතින් ජේ.වී.පී. පොලිසියනේ. දැන් මේ මේ පොලිසිය තමයි අද තංගල්ලේ තියෙන රැස්වීමට සෙනග එකතු කර ගෙනියන්නේ. දකුණේ පොලිසි වලින්. මේක දැන් ජේ වී පී පොලිස් සංගමය. අර තියනවනේ කලා සංගමය, කාන්තා සංගමය, සමාජවාදී තරුණ සංගමය, සමාජවාදී කම්කරු සංගමයේ සමාජවාදී ශිෂ්‍ය සංගමය වගේ. මේක සමාජවාදී පොලිස් සංගමය. ඒකකෙ ප්‍රධානියා තමයි ජාතික සංවිධායක පොලිස්පති ප්‍රියන්ත''. මේ තාම කොස්තාපල් මානසිකත්වයෙන් වැඩ කරන්නේ.

දැන් මේ පොලීසිය පාවිච්චි කරලා තමයි ත්‍රිකුනාමලේ බුදු පිළිමේ ඉස්සුවේ. ඒක කවුරුවත් වෙන අන්‍යාගමිකයෙක්, අන්‍ය ජාතිකයෙක් කරපු දෙයක් නෙවෙයි. බුද්ධ ශාසන අමාත්‍යංශය අහෝසි කළේ අනුර කුමාරගේ ආණ්ඩුව. පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලයට අන්‍ය ආගමික උගත්තු දෙන්නෙක් දැම්මේ අනුර කුමාරගේ ආණ්ඩුව. දෙහිවල නගර සභාවේ මාසික පෝය බණ දේශනය නැවැත්තුවේ අනුර කුමාරගේ නගරාධිපති. මන්ත්‍රීවරුන්ගේ විවේකාගාරයේ තිබ්බ්ච බුදු පිළිමේ අයින් කරේ අනුර කුමාරගේ නගරාධිපති. ඔගොස්ටින්ලාට කඨින පින්කමේ සද්දේ ඉවසගෙන ඉන්න බැරි විදියේ ''වාතාවරණය හැදුවේ'' අනුර කුමාරගේ ආණ්ඩුව තමයි.

බුද්ධ ශාසන, ආගමික කටයුතු හා සංස්කෘතික අමාත්‍යංශයේ ලොක්කා බවට ''අනාගමික මත දරන්නෙක්'' පත් කරේ අනුර කුමාරගේ ආණ්ඩුව. ඒකේ අමාත්‍යංශ ලේකම් බවට අන්‍ය ආගමිකයෙක් පත් කළේ අනුර කුමාර ආණ්ඩුව. ඒ නිසා මේ රටේ මහා සංස්කෘතියට ගහන්න තියෙන හැමතැනකින්ම ගහන ගමන්, රිද්දන ගමන්, හැමතැනකින්ම අනින ගමන් ''එන්න එපා ජාතිවාදය අවුස්සන්න'' කියලා කාටද කියන්නේ? කියන්න කණ්ණාඩියක් ගාවට ගිහිල්ලා. ඔයා තමයි නැති ජාතිවාදයක් අවුස්සන්නේ.ඒ නිසා ඒකට වගකියන්න ඕන ඔයා.

මේ ආණ්ඩුව ආර්ථික වශයෙන් අසාර්ථකයිනේ. නිල නිවාස ගන්න නෑ කිව්වා. අනේ හත් දෙනෙක්ම අරන්. කථානායකට නිල නිවාස දෙකයි. පෙම් කරන්න එකයි. රාජකාරි වලට තව එකයි. දැන් ඩබල් කැබ් 1750ක් ගන්න සල්ලි වියදම් කරනවා. අරහේ ලූණු ගොවියෝ, අල ගොවියෝ නිෂ්පාදන විකුණ ගන්න බැරුව හුල්ලනවා. 2025ට වෙන් කරපු ප්‍රාග්ධන වියදම් වලින් 22% යි වියදම් වෙලා තියෙන්නේ. 78% ක් මහා භාණ්ඩාගාරයට හරවලා ගිහිල්ලා. ඒක උතුරනලු. වියදම් කරගන්න බැරුව ආපසු හැරිලා ගියාම උතුරන් නැතෑ සල්ලි හැරිලා ගියාම. උතුරපු සල්ලි වලින් එක බිලියනක්වත් අරගෙන රට ලොකු ලූණු, අල, බඩ ඉරිඟු ගොවීන්ගෙන් මිලදී ගෙන හිරකාරයන්ට, ත්‍රිවිධ හමුදාවට, පොලීසියට දෙන්න තිබ්බා. ඒවට මොළේ නැහැ.

මේ ආණ්ඩුව කරවන්නේ බාහිර වශයෙන් ජූලියා. ''ජූලී චන් නෝනා''. මේක තමයි නියම ''රක්ත වර්ණධාරී නවලිබරල්වාදය'' කියලා කියන්නේ. ජූලි චන් නෝනා තමයි මේ ආණ්ඩුවේ බාහිර බලවත් බවලතා. ඇමතිවරු මොනවද කරන්නෙ. යනවා, අහන් ඉන්නවා , අනුමත කරනවා. එනවා. ඇත්ත ඇමති මණ්ඩලය මොකක්ද? මොනවද කරන්නේ?

එතන පස්දෙනයි. එයාලා ''පංච මහා චෞරයෝ''. ජනාධිපතිට අමතරව ප්‍රකෝටිපතියන් පස් දෙනෙක් තමයි ඇත්තටම අනුර කුමාරත් එක්ක ආණ්ඩුව ගෙනියන්නේ. ජූලියාට අමතරව. මේ පස් දෙනා කවුද? මණික් සමරවික්‍රම, ධම්මික පෙරේරා, ක්‍රිෂාන් බාලේන්ද්‍ර, හනීෆ් යුසුෆ්, ඉෂාර නානායක්කාර''.මේ පස් දෙනාගේ ගෙවල් වලට ගිහිල්ලා තමයි රාජ්‍ය පාලනයේ ආර්ථික කළමනාකරණයේ සියලු උපදෙස් ගන්නේ.

මේ පහ තමයි ''සුපිරි චෞරයේ පහ''. මේ පස් දෙනාගේ මගපෙන්වීම මත තමයි අනුර කුමාරගේ නවලිබරල්වාදී ආර්ථික මග හැදෙන්නේ. පස් දුන් කට්ටුව වාණිජ්‍ය මණ්ඩලය අපේ යෝජනා වලින් යෝජනා 18ක්ම අයවැයට දැම්මා කියලා කියන්නේ.

රුපියල් ලක්ෂක පිරිවැටුමක් තියෙන පුංචි කඩේටත් වැට් එක බලපාන තත්වෙට වැට් එක පරාසය පළල් කළේ. මේ පසු දුන් කට්ටුවේ න්‍යාය පත්‍රය අනුවයි අයි එම් එෆ්ට අමතරව. ඒ නිසා අපි තේරුම් ගන්න ඕනා. එක පැත්තකින් ආර්ථිකයේ බංකොලොත්භාවයේ ගොඩගන්වා වෙනුවට තව තවත් අවධානම දිසාවට ඇදගෙන යනවා, උත්තර නැහැ. ගොවියෝ හතර සාතෙන් වැටිලා ඉන්නවා, උත්තර නැහැ. ආණ්ඩුවේ ජනප්‍රියතාවයක් තිබ්බනං ඒක දවසින් දවස වේගයෙන් බිඳ වැටෙනවා, උත්තර නැහැ. උත්තර නැති වෙනකොට බටහිරයි ඩැෂ්පෝරාවයි දීපු ලනු ටික කවන්න හදනවා. ඒ ක්‍රියාමාර්ග ටික උස්සන්න කරන්න හදනවා රණවිරුවන් දඩයම් කරමින්. අර පස්දුන් කට්ටුවට ඕන විදියට මහා පරිමාණ ට්‍රිලියනපතියන්ට ඕන විදියට රටේ ආර්ථිකය මෙහෙයවනවා. ඒ මගින් පොදු ජනතාව දවසින් දවස ඉතා අසරණ තත්ත්වයකට වැටෙනවා. රණවිරුවන් පිටින් තියෙලා අසාර්ථක භාවය වපුරන්න හදනවා.

ජේ ආර් ජයවර්ධන එදා ඔහුගේම ගෝල බාලයන් ලව්ව ''කලු ජූලි හදලා'' යාපනයේ පුස්තකාල ඔහුගේම ගෝල බාලයන් ලවුවා ගිනි තියවලා, වගකීම දේශපාලන පක්ෂ මත පටවලා, තහනම් කරලා රට නැති ගින්නකට ඇතුළු කළා වගේ, මේ උන්දැත් හදනවා තමන්ගේ කට්ටිය ලව්වම බුදුපිළිම උස්සලා, බුදුපිළිම අත්අඩංගුවට අරගෙන, බුදුපිළිමාරක්ෂා කරන්න. බුදුපිළිම තියෙන තැනින් ආරක්ෂා කරන්න උස්සන්ගිය කාලයක් ලංකාවේ හැත්තෑ වසරක තිබිල නෑ.

එවැනි ඒ ඒ ඒ විදියේ ප්‍රකෝපකාරී ක්‍රියා සිදුකරලා නැති ජාතිවාදයක් ඇති කරන්න හදනවා. ඒ මගින් හරි ලේ ගංගා නිර්මාණය කරලා හරි තමන්ගේ බලය පවත්වාගෙන යන්න. එනිසා අපි රටේ ජනතාවට අනතුරු අඟවනවා ''නියම ජාතිවාදී උසිගැන්වීමෙන්'' ආණ්ඩුවෙ නියම ලේ දැකීමේ අනාගත අවස්ථාව නිර්මාණය කරන්න ඉවහල් වන්නේ ආණ්ඩුවෙන්, ඒකට ගොදුරු වෙන්නේ නැතුව, පරගැති පාලනය පරාජයට පත්කරන්න බුද්ධිමත්ව සබුද්ධිකව අපි ක්‍රියාත්මක වෙමු. ඒ හැර අන් මගක් අප හමුවේ නෑ .